සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

# ගණිතය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ ..........................................................................................................................

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන රූප සටහනට අනුව දී ඇති B හා C ලක්ෂ්‍යය × ලකුණ මගින් ලකුණුකර දක්වන්න.

A වෘත්තය මත රූපයේ ලකුණුකර ඇත.
B වෘත්තය පිටත.
C වෘත්තය ඇතුළත.




02. පහත භාග සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සකසා නැවත ලියන්න.

$\frac{6}{7}, \frac{1}{7}, \frac{3}{7}, \frac{5}{7}$

03. සංඛ්‍යා රේඛාව මත සළකුණු කර ඇති සංඛ්‍යා අනුව හිස්තැන් සඳහා < , > , = සළකුණු යොදන්න.




1 ...................... - 4 +4 ...................... 4

04. හිස්තැන්වලට සුදුසු අගයන් යොදන්න.

2085 m = ........................... km ....................... m

05. 254 304 078 සංඛ්‍යාව වචනයෙන් ලියන්න.

06. ඉරෝෂ්, මීටර 10 ක් A ලක්ෂ්‍යයේ සිට නැගෙනහිර දිශාවට ගොස් එතැන් සිට තවත් මීටර 10 ක් උතුරට ගොස් B ලක්ෂ්‍යයට පැමිණේ. දැන් ඔහුට එම ස්ථානයේ සිට A ලක්ෂ්‍යය පෙනෙන්නේ කුමන දිශාවෙන් ද?

07. ගැමුණු විද්‍යාලයේ වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය 2024 වසරේ මාර්තු නව වන දින පැවැත්වීමට තීරණය කර ඇත. මෙහි දිනය සම්මත ආකාරයට ලියා දක්වන්න.

08. 4, 19 හි සාධකයක් වේද නොවේ ද? හේතු දක්වන්න.

09.




රූප සටහන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරා ඉරක් අඳින්න.

- A සමචතුරස්‍රයක් සහ B රොම්බසයක් වේ.
- A සමචතුරස්‍රයක් සහ B සමාන්තරාස්‍රයක් වේ.
- A සෘජුකෝණාස්‍රයක් සහ B ත්‍රිපීසියමක් වේ.

10. **25.37** යන දශම සංඛ්‍යාවේ 7 ඉලක්කමෙන් නිරූපණය වන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියා දක්වන්න.

11. දිග මැනීම සඳහා යොදාගන්නා උපකරණ දෙකක නම් සඳහන් කරන්න.

12. අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් භාගයක් ලෙස සරලම ආකාරයෙන් ලියන්න.



13. පළමු සංයුක්ත සංඛ්‍යාව තෝරා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

4 ,    2 ,    1 ,    6

14. හිස්තැන්වලට සුදුසු අගය ලියන්න.

(i) 36 x 1000 = ........................................

(ii) 50 100 ÷ 100 = ........................................

15. ප.ව. 12.50 වේලාව සම්මත ආකාරයට ලියන්න.

16. එකම වර්ගයේ අභ්‍යාස පොත් 132 ක් සිසුන් 6 දෙනෙකු අතර සමානව බෙදාදුන් විට එක් අයකුට ලැබෙන පොත් සංඛ්‍යාව කීය ද?

17.




1ℓ 120 mℓ

B භාජනය සම්පූර්ණයෙන්ම ජලයෙන් පිරී ඇති විට, එම ජලය භාවිතයෙන් A භාජනය දෙවරක් සම්පූර්ණයෙන්ම පිර වූ පසු B භාජනයේ තවත් 175 ml ක ජලය ප්‍රමාණයක් ඉතිරි වේ නම් B භාජනය සම්පූර්ණයෙන්ම පිරවීමට අවශ්‍යය ජල පරිමාව සොයන්න.

18. 4 3 ☐ යන ඉලක්කම් තුනකින් යුත් සංඛ්‍යාවේ එකස්ථාන ඉලක්කම 4 ට වැඩි අගයක් වේ. මෙම සංඛ්‍යාව දෙකෙන් බෙදෙන සංඛ්‍යාවක් වේ නම් හිස් කොටුවට යෙදිය හැකි අගයන් දෙකක් ලියන්න.

19. පහත දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

(a) 1 යනු ප්‍රථමක සංඛ්‍යාවකි ☐

(b) සියළු සමචතුරස්‍ර සංඛ්‍යා සංයුක්ත සංඛ්‍යා වේ. ☐

20. සුදුසු පරිදි සමූහ දෙකකට වෙන්කරන්න.




**II - කොටස**

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට (මුළු ප්‍රශ්න ගණන පහකි) නිවැරදි පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර සඳහා ලකුණු 16 ක් ද අනිකුත් ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.**

01. (a) (i) පහත රූප අතරින් සෘජුකෝණ දැක්වෙන රූප තෝරා ලියන්න.




(ii) සෘජු කෝණයකට වඩා විශාලත්වයෙන් අඩු කෝණ වර්ගය හඳුන්වන නම ලියන්න.

..........................................................................................

(iii) පරාවර්ත කෝණය ඇඳ දක්වන්න.

(iv) සරල කෝණයෙන් සුළු කෝණයක කොටසක් වෙන්කල පසු ඉතිරි වන කෝණ වර්ගය හැඳින්වීමට සුදුසු නම ලියන්න.

..........................................................................................

(b) (i) පහත රූප අතරින් සරල රේඛීය සංවෘත තලරූප තෝරා යටින් ඉරක් අඳින්න.



(ii) ඍජුකෝණාස්‍රයක ලක්ෂණ දෙකක් ලියන්න.

..........................................................................................

..........................................................................................

(iii) ත්‍රිපීසියමක හැඩය අඳින්න. එම හැඩ තලය දෙවතාවක් භාවිතයෙන් සෑදිය හැකි චතුරස්‍ර වර්ගයක් නම් කරන්න.

..........................................................................................

(iv) සමචතුරස්‍රයක දැකිය හැකි රොම්බසයක දැකිය නොහැකි ලක්ෂණයක් ලියන්න.

..........................................................................................

02. (a) (i) 18 හි සියලු සාධක ලියන්න.

..........................................................................................

(ii) 30 හි සාධක ඇසුරින් ප්‍රථමක සංඛ්‍යා වන සාධක දෙකක් ලියන්න.

..........................................................................................

(iii) 6 සහ 8 යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාර වන සංඛ්‍යා දෙකක් ලියන්න.

..........................................................................................

(iv) දහය ගුණාකාරයක් විය හැකි සංඛ්‍යා 3 ක් ලියන්න.

..........................................................................................

(b) (i) අඹ ගොඩක ඇති අඹ ගණන ආසන්න 10 ට වටයූ විට 120 ලැබේ. අඹ ගොඩේ තිබිය හැකි අඩුම අඹ ගෙඩි ගණන කීය ද?

..........................................................................................

(ii) නිමානය යොදා ගත හැකි අවස්ථාවක් ලියන්න.

..........................................................................................

03. (a) (i) පහත මිනුම්වල සංකේත ලියන්න.

මිලි ලීටර ....................

ලීටර ....................

(ii) ඉහත ඒකක දෙක අතර සම්බන්ධය ලියන්න.

..........................................................................................

(iii) මිලි ලීටර 2240 ද්‍රව ප්‍රමාණය ලීටර හා මිලි ලීටර් වලින් දක්වන්න.

..........................................................................................................

(iv) සුළු කරන්න.

(a)

| ලීටර | මිලි ලීටර |
|---|---|
| 3 | 900 |
| + 2 | 400 |
| | |

(b)

| ලීටර | මිලි ලීටර |
|---|---|
| 3 | 100 |
| - 1 | 700 |
| | |

04. (a) (i) පහත රූපවලින් සරල රේඛා ඛණ්ඩය තෝරා යටින් ඉරක් අඳින්න.




(ii) 1 cm 2 mm මගින් දැක්වෙන දිග මිලි මීටර වලින් දක්වන්න.

..........................................................................................................

(iii) දිග පළල මෙන් දෙගුණයක් වන සෘජුකෝණාස්‍ර කාඩ් පතක දිග සම්බන්ධ මිනුම ලබා ගන්නා අවස්ථාව පහත වේ. මිනුම් නිරීක්ෂණය කර කාඩ්පතේ පරිමිතිය සොයන්න.




(iv) කාණුවක් කැපීම සඳහා 1 m ක දිගකට රු. 80 ක් අය කරයි. මිනිසෙකුට 7500 cm දිග කාණුවක් කැපීම සඳහා කොපමණ මුදලක් ගෙවිය යුතු ද?

..........................................................................................................

05. (a) භාග පාඩම ඉගැන්වීමේදී ගුරුතුමිය විසින් පහත භාග සංඛ්‍යා කළුලෑල්ලේ ලියා දක්වන ලදී.

$$\frac{1}{2}, \frac{3}{4}, \frac{1}{3}, \frac{3}{6}, \frac{3}{8}, \frac{5}{10}, \frac{7}{12}, \frac{4}{9}$$

ඉහත දී ඇති භාග අතුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඒකක භාග සියල්ල තෝරා ලියන්න.

..........................................................................................................

(ii) $\frac{5}{10}$ ට තුල්‍ය භාග තෝරා ලියන්න.

..........................................................................................................

සුළු කරන්න.

(iii) $\frac{1}{4} + \frac{3}{8}$

(iv) $\frac{3}{5} - \frac{7}{15}$

(b) (i) **1.03** කියවන ආකාරය ලියන්න.

..........................................................................................................

(ii) ඉහත දශම සංඛ්‍යාව ගණක රාමුවක නිරූපණය කරන්න.

06. (a) විද්‍යාදීප විද්‍යාලයේ 6 ශ්‍රේණියේ ළමුන්ගේ උපන් දවස පිළිබඳ තොරතුරු පහත වේ.

1 , 2, 5 , 8 , 9 , 10 , 12 , 13 , 15 , 17 , 25 , 27 , 31

(i) ඉරට්ට දිනවල ඉපදී ඇති ළමුන් ගණන කීය ද?

..........................................................................................................

(ii) ඉහත දිනවලින් සමචතුරස්‍ර සංඛ්‍යා තෝරා ලියන්න.

..........................................................................................................

(iii) ප්‍රථමක සංඛ්‍යාවක් දැක්වෙන දිනයක ඉපදුණු ළමුන් ගණන සහ ත්‍රිකෝණ සංඛ්‍යාවක් දැක්වෙන දිනයක ඉපදුණු ළමුන් ගණන ලියා ඒ අතරින් වැඩි ළමුන් පිරිසක් ඉපදී ඇති දින අයත් සංඛ්‍යා වර්ගය ලියන්න.

..........................................................................................................

(iv) සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා පාඩමේ ඔබ උගත් සංඛ්‍යා වර්ග අතරින් සංඛ්‍ය රටා ලෙස පවතින සංඛ්‍යා වර්ග තුනක් ලියන්න.

..........................................................................................................

07. (i) පහත චතුරස්‍ර භාවිතයෙන් සැකසිය හැකි ඝන වස්තුවක පතරම අඳින්න.



(ii) එමගින් සෑදෙන ඝන වස්තුවේ මුහුණත් ගණන, ශීර්ෂ ගණන, දාර ගණන ලියන්න.

..........................................................................................................

(iii) ඉහත ඝන වස්තුවේ හැඩය පරිසරයේ දැකිය හැකි අවස්ථා 2 ක් නම් කරන්න.

..........................................................................................................

(iv) මුහුණත් සියල්ල සමාන වන ඝන වස්තු දෙකක් නම් කරන්න.

..........................................................................................................